GMOA
ESTABLISHED IN 1926
TU No. 291
THE GOVERNMENT MEDICAL OFFICERS' ASSOCIATION
No.275/75, Professional Centre, Prof. Stanley Wijesundara Mawatha, Colombo 07
Tel : 2580886 / 2055415 / 0718552552
Fax : 4518668 / 2503586
Web : www.gmoa.lk
Email : info@gmoa.lk
office@gmoa.lk

GMOA/President/2016/0001
2016/01/04

අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා.
ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය,
ජනාධිපති ලේකම් කාර්යාලය,
කොළඹ 01.

අතිගරු ජනාධිපතිතුමණී,

**ජාත්‍යන්තර වෙළඳාම හා වෙළඳ ගිවිසුම් පිළිබඳව ජාතික ප්‍රතිපත්තියක අවශ්‍යතාවය**

ඉන්දු ලංකා වෙළඳ හෝ සහයෝගිතා ගිවිසුමක් මේ වර්ෂය තුලදී අත්සන් කරන බව රජය ප්‍රකාශ කර ඇත.

වෙළඳ ගිවිසුම් තුලින් රටේ අනන්‍යතාවයටත්, පුරවැසියන්ගේ සුරක්ෂිතභාවයටත් හානියක් නොවන අයුරින් එය සැකසිය යුතුය. එපමණක් නොව ඒ තුලින් රටට සහ රට වැසියන්ට අන්‍යෝන්‍ය වශයෙන් වාසියක් සැලසිය යුතුය. දැනට පවතින ඉන්දු ලංකා භාණ්ඩ ගිවිසුමෙන් ලංකාවට වාසියක් අත් වී නැත. එම ගිවිසුමට උපදේශනය ලබාදුන් පිරිස සහ එය සැකසූ අය එහි වගකීම භාර ගන්නා බවක්ද පෙනෙන්නට නැත. එහි පාඩුව රටේ පුරවැසියන් විඳ දරා ගත යුතුව ඇත. හෙයින් ගිවිසුමෙන්ද මේ අයුරින්ම සිදුවූ විශාල අලාභය පරම්පරා ගණනක් අප ගෙවිය යුතුය.

මෙවැනි ද්විපාර්ශවික ගිවිසුම් ලංකාවේ අධිකරණය අභිබවා යයි. ගිවිසුමක ඇති අඩුපාඩු නිවැරදි කර ගැනීමකට ඇති ක්‍රමවේදය බේරුම්කරණයයි. එය තාක්ෂණික හා නීතිමය වශයෙන් ශ්‍රී ලංකාව වැනි රටකට ඉතා සංකීර්ණ හා අපහසු කටයුත්තක් වන අතර අති මහත් මුදල් සම්භාරයක් වැය වන කටයුත්තකි. එය ශ්‍රී ලංකාව වැනි රටකට ඔරොත්තු නොදෙන තරමේ කටයුත්තක් බව හෙජින් ගිවිසුම බේරුම්කරණයේදී මනාව පැහැදිලි විය.

මේ වසරේ අත්සන් කරන බව පවසන ඉන්දු ලංකා ගිවිසුම උපදේශනය කරන පිරිසත්, එය සකස් කරන පිරිසත්, එහි පාරදෘෂ්‍යභාවය රකින බවක් පෙනෙන්නට නැත. කෙසේ නමුත් ගරු මලික් සමරවික්‍රම ඇමතිතුමා යම් තොරතුරු ප්‍රමාණයක් අප වෙත ලබා දීමට ගත් උත්සාහය අපි අගය කරමු. නමුත් මේ ගිවිසුම තුලින් අපේ රටට සිදුවේ යැයි පවසන වාසිය ගැන අප සාමාජිකත්වය පැහැදී නැත. ඇත්ත වශයෙන්ම මෙම ගිවිසුම තුලින් දැනට අවාසි සහගත තත්ත්වයක් පවතින ඉන්දු ලංකා භාණ්ඩ ගිවිසුමට වඩා විශාල හානියක් වනු ඇතැයි ඔවුන්ගේ මතය වී ඇත.

එබැවින් **ජාත්‍යන්තර වෙළඳාම හා වෙළඳ ගිවිසුම් සම්බන්ධයෙන් ජාතික ප්‍රතිපත්තියක් සැකසීම කළ යුතු බවත්, එතෙක් ඉන්දු ලංකා වෙළඳ ගිවිසුම අත්සන් නොකල යුතු බවත්** අපි යෝජනා කරමු. ඒ තුලින් සැකයට සහ නොසන්සුන්තාවයට ලක්ව ඇති බොහෝ කාරණා විශ්ලේෂණයකට ලක් වනු ඇත.

අත්තනෝමතික තීරණ වලට වඩා ප්‍රතිපත්ති ගරුක තීරණ වලට හිස නවන රාජ්‍යයක් බිහි කිරීමට නායකත්වය දුන් ඔබතුමාගෙන්, අපගේ මෙම යෝජනාව ක්‍රියාත්මක කරන ලෙස අපි ඉතා කාරුණිකව ඉල්ලා සිටිමු.

ස්තුතියි,

වෛද්‍ය අනුරුද්ධ පාදෙනිය
සභාපති

වෛද්‍ය නලින්ද හේරත්
ලේකම්

පිටපත් -
ගරු අග්‍රාමාත්‍යතුමා
ගරු කථානායකතුමා
සියළුම ගරු අමාත්‍යවරුන්
සියළුම ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්
ජනාධිපති ලේකම්තුමා
අග්‍රාමාත්‍ය ලේකම්තුමා
රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමයේ සියළුම ශාඛා සංගම්